සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)

# 33 - ඉතිහාසය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)

## 33 - ඉතිහාසය

**I පත්‍රය - ලකුණු 1 x 40 = ලකුණු 40**

---

**II පත්‍රය -**

**I කොටස**

ප්‍රශ්න අංක 1 (අනිවාර්ය ප්‍රශ්නයකි.)

| | | | | |
|---|---|---|---|---|
| (අ) කොටස | - | ලකුණු | 18 | ලකුණු 30 |
| (ආ) කොටස | - | ලකුණු | 12 | |

**II කොටස**

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 2 | - | ලකුණු | 18 | (ඕනෑම ප්‍රශ්න 4කට) 4 x 18 = ලකුණු 72 |
| ප්‍රශ්න අංක 3 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 4 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 5 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 6 | - | ලකුණු | 18 | |
| ප්‍රශ්න අංක 7 | - | ලකුණු | 18 | |

**III කොටස**

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රශ්න අංක 8 | - | ලකුණු | 18 | (ඕනෑම ප්‍රශ්න 1කට) 1 x 18 = ලකුණු 18 |
| ප්‍රශ්න අංක 9 | - | ලකුණු | 18 | |

**ලකුණු 120**

### අවසාන ලකුණු ගණනය කිරීම

* සමස්ත පිළිතුරු පත්‍රයේ අවසන් ලකුණු මණ්ඩලය තුළ දී ගණනය කිරීම සිදු නොකෙරේ.

**ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුලත් කල යුතු ආකාරය.**

I පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 2 කින් ඇතුලත් කළ යුතුය.

II පත්‍රය මුළු ලකුණු ඉලක්කම් 3 කින් ඇතුලත් කළ යුතුය.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ — එකතුව → □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත්**

**පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

> සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**
>
> **(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

# I පත්‍රය - ඉගෙනුම් පල

- ඉතිහාසය 10 සහ 11 ශ්‍රේණිවලට අදාල විෂය නිර්දේශවල ඇතුලත් ඉගෙනුම් පල ආවරණය වන පරිදි ඓතිහාසික සිද්ධීන් හා සංකල්ප පිළිබඳ දැනුම, අවබෝධය, භාවිතය, විශ්ලේෂණ, සංස්ලේෂණ හැකියා පිරික්සීම

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

ඉතිහාසය I
வரலாறு I
History I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

**උපදෙස්:**

※ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ශ්‍රී ලංකාවේ ඉතිහාසය අඛණ්ඩව රචනා වන කෘතිය මින් කුමක් ද?
(1) දීපවංසය (2) මහාවංසය (3) පූජාවලිය (4) රාජාවලිය

**2.** ආක්‍රමණිකයකු වුවද, සාධාරණ හා නීතිගරුක පාලනයක් ගෙන ගිය බව මහාවංසයේ සඳහන් වන පාලකයා මින් කවරෙක් ද?
(1) එළාර (2) රාජරාජ (3) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ (4) රාජේන්ද්‍ර චෝල

**3.** අත්හැර දැමූ වැව්ගම් හැඳින්වූ නම කුමක් ද?
(1) පරිබිත්ත ගම් (2) අපරික්ඛිත්ත ගම් (3) නියම් ගම් (4) ඔළගම්

**4.** ගම් නායකයෙකු වීම සඳහා අවශ්‍ය යැයි සැලකුන වැදගත් ම සුදුසුකම මින් කුමක් ද?
(1) දේශපාලන පළපුරුද්ද (2) ආර්ථික වශයෙන් වත් පොහොසත් වීම
(3) ගම්වැසියන් අතර ජනප්‍රිය වීම (4) උසස් කුලයකින් පැවත ඒම

**5.** මෙරට පළාත්වලට බෙදා ඒ ඒ පළාත් භාරව ඇමතිවරුන් පත්කළ බවට සැලකෙන ප්‍රථම පාලකයා වන්නේ,
(1) පණ්ඩුකාභය රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.
(3) වසභ රජතුමා ය. (4) පළමුවෙනි විජයබාහු රජතුමා ය.

**6.** පහත දැක්වෙන කරුණු අතුරෙන් රටේ ආර්ථිකය සවිමත් කිරීම සඳහා පළමුවන විජයබාහු රජතුමා අනුගමනය කළ වැදගත් පියවරක් වන්නේ,
(1) පොලොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම ය.
(2) චෝලයන්ගෙන් රට මුදාගැනීම ය.
(3) අසල්වැසි රටවල් සමග මිත්‍ර සබඳතා ඇතිකර ගැනීම ය.
(4) මහාපරිමාණ වැව් අමුණු තැනවීම ආරම්භ කිරීම ය.

**7.** ආර්ථිකයට සිදු කළ සේවාව නිසා දේවත්වයට පත් වූ රජ කෙනෙකු වූයේ,
(1) වසභ ය. (2) මහසෙන් ය. (3) ධාතුසේන ය. (4) මහා පරාක්‍රමබාහු ය.

**8.** පහත **I** තීරුවේ රජවරු කිහිපදෙනෙකු හා **II** තීරුවේ එම රජවරු සම්බන්ධ කරුණු කිහිපයක් දැක්වේ. **I** තීරුව අනුව **II** තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. පණ්ඩුකාභය රජතුමා | A – දිවයින එක්සේසත් කිරීම |
| 2. භාතිකාභය රජතුමා | B – ප්‍රථමවරට ග්‍රාම සීමා නියම කිරීම |
| 3. දුටුගැමුණු රජතුමා | C – කලා වැව ඉදිකිරීම |
| | D – තානාපතිවරුන් රෝමයට යැවීම |

(1) A, B හා C (2) A, C හා D (3) B, A හා C (4) B, D හා A

**9.** අතීතයේ සිට ශ්‍රී ලංකාව අන්තර්ජාතික වෙළෙඳ කටයුතුවලදී වැදගත් වීමට හේතුව වූයේ,
(1) කුඩා දූපතක් වීමයි.
(2) ඉන්දියාවෙන් වෙන්ව පිහිටා තිබීමයි.
(3) ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීමයි.
(4) ත්‍රිකුණාමලය වරායේ ස්වභාවික පිහිටීමයි.

**10.** වැවක බැම්ම ගිලා නොබැසීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ගයක් වූයේ මින් කුමක් ද?
(1) පිහිටි ගලක් තෝරා වැව් බැම්ම ඉදිකිරීම
(2) ශක්තිමත් කළු ගලෙන් වැව් බැම්ම ඉදිකිරීම
(3) පිටවාන මගින් වැඩි ජලය පිටකිරීම
(4) සලපනාව ශක්තිමත්ව ඉදිකිරීම

● පහත A සිට E දක්වා ප්‍රකාශ හොඳින් කියවා 11 සහ 12 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A – උද්‍යාන සැලසුම්කරණය පිළිබඳ විශිෂ්ට දැනුමක් තිබීම
B – ආරක්ෂාව සඳහා දිය අගල් හා ගඩොල් ප්‍රාකාර භාවිත කිරීම
C – අත්තිවාරම සැකසීම නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන වීම
D – සනීපාරක්ෂාව හා ස්වස්ථතාව පිළිබඳ මනා දැනුමක් තිබීම
E – ශල්‍ය වෛද්‍ය උපකරණ භාවිත කළ බවට සාධක හමුවීම

**11.** සීගිරිය සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

**12.** ආලාහන පිරිවෙන සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

**13.** පානීය ජලයේ නියමිත ප්‍රමිතිය හා සිසිලනය ආරක්ෂා කරගැනීම සඳහා අතීතයේ ඉදිකරන ලද නිර්මාණය කුමක් ද?
(1) පොකුණු (2) ආඩියා ළිං (3) ඌරාකැට ළිං (4) අමුණු

**14.** පරිසරය ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කළ යුතු නීතිරීති ඇතුළත් වූ අභිලේඛණය කුමක් ද?
(1) ගල්පොත සෙල්ලිපිය
(2) අනුරාධපුර පුවරු ලිපිය
(3) පනාකඩුව තඹ සන්නස
(4) තෝනිගල සෙල්ලිපිය

**15.** අපේ රටේ ඉතා පුරාණ කාලයේ සිට විසූ ජනතාව කැඳ වර්ග තම ආහාරය සඳහා එක්කර ගැනීමට ප්‍රධානතම හේතුව වූයේ කුමක් ද?
(1) සකසා ගැනීමට පහසු වීම
(2) දිරවා ගැනීමට පහසු වීම
(3) කැඳ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සුලභ වීම
(4) ශරීර ශක්තිය වර්ධනය වීම

**16.** කාලිංග මාඝ හා චන්ද්‍රභානු යන ආක්‍රමණිකයන්ගෙන් රට මුදාගත් පාලකයා
(1) පළමුවන විජයබාහු ය.
(2) පළමුවන පරාක්‍රමබාහු ය.
(3) දෙවන පරාක්‍රමබාහු ය.
(4) තුන්වන විජයබාහු ය.

**17.** ශ්‍රී ලංකාවේ පැවති රාජධානි කිහිපයක් I තීරුවේ ද, පැරණි පරිපාලන බෙදීම් කිහිපයක් II තීරුවේ ද දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අනුරාධපුරය | A – මායාරට |
| 2. මහනුවර | B – රජරට |
| 3. කෝට්ටේ | C – රුහුණුරට |
| | D – මලයරට |

(1) A, B හා C (2) A, B හා D (3) B, A හා C (4) B, D හා A

**18.** මහනුවර ප්‍රථමවරට ස්වාධීන රාජධානියක් ලෙස ගොඩනගන ලද රජතුමා
(1) පළමුවන රාජසිංහ ය.
(2) සේනා සම්මත වික්‍රමබාහු ය.
(3) ජයවීර බණ්ඩාර ය.
(4) පළමුවන විමලධර්මසූරිය ය.

● පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් 19 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.

A – ජාතික රාජ්‍යයන් බිහිවීම
B – වෙළෙඳාමේ දියුණුව

**19.** යුරෝපයේ පුනරුදය සම්බන්ධයෙන්
(1) A හා B සත්‍ය වේ.
(2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

**20.** දුරදක්නය නිපදවනු ලැබුවේ කවුරුන් විසින් ද?
(1) නිකලස් කොපර්නිකස් (2) ජොහැන්නස් කෙප්ලර්
(3) ජොහැන්නස් ගුටෙන්බර්ග් (4) ගැලීලියෝ ගැලිලි

**21.** කාර්මික විප්ලව සමයේ සායම්, ඖෂධ, තෙල් සහ පොහොර යන අතුරු නිෂ්පාදන හේතුවෙන් දියුණුවට පත් කර්මාන්තය කුමක් ද?
(1) පේෂ කර්මාන්තය (2) යකඩ හා වානේ කර්මාන්තය
(3) ගල් අඟුරු කර්මාන්තය (4) කෘෂි කර්මාන්තය

**22.** කාර්මික විප්ලව සමයේ වගා කටයුතු සඳහා ශෂ්‍ය මාරු ක්‍රමය හඳුන්වාදීම මගින් සිදු වූ වාසියක් වන්නේ මින් කුමක් ද?
(1) වගාවට වැළඳෙන ලෙඩරෝග ව්‍යාප්තිය අවම වීම
(2) වැපිරීමට අවශ්‍ය බීජ ප්‍රමාණය අඩු කරගැනීමට හැකිවීම
(3) අවම ජල පහසුකම් යටතේ වගා කිරීමට හැකිවීම
(4) ඕනෑම කාලගුණ තත්වයකට වගාව ඔරොත්තු දීම

**23.** පහත A සිට D දක්වා දී ඇති ස්ථාන අතුරෙන් ඉංග්‍රීසින් විසින් ඉන්දියාවේ පිහිටුවන ලද වෙළෙඳ මධ්‍යස්ථාන දැක්වෙන පිළිතුර කුමක් ද?
A – මදුරාසිය B – බොම්බාය
C – පොන්ඩිචෙරි D – චන්ද්‍රනගර්
(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

**24.** උඩරට රාජධානිය නිල වශයෙන් බ්‍රිතාන්‍යයන්ට පවරාදෙන ලද්දේ,
(1) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අත්අඩංගුවට පත් වූ පසුව ය.
(2) 1815 උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව ය.
(3) 1818 ප්‍රකාශනයෙන් පසුව ය.
(4) 1833 කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණවලින් පසුව ය.

**25.** ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය වරාය කෙරෙහි ඉංග්‍රීසින්ගේ අවධානය යොමුවීමට ප්‍රධානතම හේතුව වූයේ,
(1) ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය රැකගැනීමේ අවශ්‍යතාවයයි.
(2) ත්‍රිකුණාමලය වරාය අවටින් වටිනා වෙළෙඳ ද්‍රව්‍ය ලබාගත හැකි වීමයි.
(3) විදේශ වෙළෙඳාම සඳහා සුදුසු වරායක් වීමයි.
(4) විශාල නැව් නවතා තැබිය හැකි වරායක් වීමයි.

**26.** ඉංග්‍රීසින්ට මහනුවර රාජධානිය පහසුවෙන් යටත් කරගැනීමට තුඩුදුන් වැදගත් ම සාධකය වූයේ,
(1) මහජනතාව ඉංග්‍රීසින්ට එකතු වීමයි.
(2) ඉංග්‍රීසින්ගේ යුද ශක්තියයි.
(3) රජු හා මහජනතාව අතර සබඳතාව දුරස් වීමයි.
(4) ඉංග්‍රීසින්ට මුහුදුබඩ වැසියන් සහයෝගය දැක්වීමයි.

**27.** කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවනු ලැබුවේ කවුරුන් විසින් ද?
(1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා (2) ඔරාබි පාෂාතුමා
(3) ඇම්.සී. සිද්දි ලෙබ්බේ මහතා (4) ටී.බී. ජයා මහතා

**28.** වර්ච් මිෂනාරි සංවිධානය විසින් පළකරන ලද ප්‍රකාශනය මින් කුමක් ද?
(1) ලක්මිණි පහන (2) මාසික තෑග්ග (3) ලංකා ලෝකය (4) සරසවි සඳරැස

**29.** යුරෝපීය ව්‍යාපාරිකයන් විසින් ගෙනගිය උද්ඝෝෂණවල ප්‍රධාන අරමුණ වූයේ මින් කුමක් ද?
(1) ආණ්ඩුකාරවරයාගේ බලතල සීමා කරගැනීම
(2) ව්‍යවස්ථාදායක සභාවට ජනවර්ග අනුව නියෝජිතයන් තේරීම අවලංගු කිරීම
(3) ව්‍යවස්ථාදායක සභාවට පත් කරන නිලලත් සාමාජික සංඛ්‍යාව වැඩි කර ගැනීම
(4) වතු වගාවට අවශ්‍ය යටිතල පහසුකම් දියුණු කර ගැනීම

**30.** ඩොනමෝර් ප්‍රතිසංස්කරණය යටතේ ඡන්ද බලය හිමි වූයේ,
(1) උගත් ලාංකිකයන්ට පමණි. (2) වයස අවුරුදු 18 ට වැඩි පිරිමින්ට පමණි.
(3) වයස අවුරුදු 18 ට වැඩි සියලුම දෙනාටම ය. (4) වයස අවුරුදු 21 ට වැඩි සියලුම දෙනාටම ය.

**31.** ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා කවුද?
(1) ඩී. බී. ජයතිලක මහතා
(2) එෆ්. ආර්. සේනානායක මහතා
(3) පොන්නම්බලම් අරුණාචලම් මහතා
(4) ජේම්ස් පීරිස් මහතා

**32.** රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ලාංකික අමාත්‍යවරුන් සතු **නොවූ** විෂය ක්ෂේත්‍රයක් වන්නේ,
(1) අධ්‍යාපනයයි.
(2) මුදල් කටයුතුයි.
(3) පළාත් පාලනයයි.
(4) සෞඛ්‍යයයි.

**33.** ශ්‍රී ලංකාවේ තේ වගාව සඳහා උචිත **නොවූ** ප්‍රදේශය මින් කුමක් ද?
(1) පහතරට තෙත් කලාපය
(2) වියළි කලාපය
(3) කඳුකර තෙත් කලාපය
(4) තෙත් උස් කඳුකර කලාපය

**34.** මෙරට දී සිංකෝනා වගාව අසාර්ථක වීමට මුල් වූ ප්‍රධානතම හේතුව කුමක් ද?
(1) වගාකරුවන්ට සිංකෝනා වගාව පිළිබඳ අවබෝධයක් නොතිබීම
(2) වගාව සඳහා මුදල් යෙදවීමට ප්‍රමාණවත් ආයෝජකයන් පිරිසක් නොමැති වීම
(3) බෙහෙත් පැළෑටියක් වීම නිසා සිංකෝනා සඳහා ඉල්ලුම සීමිත වීම
(4) සිංකෝනා වගාවට අවශ්‍ය සෙවන ලබාදීම සඳහා අමතර වියදමක් දැරීමට සිදුවීම

- පහත A සිට D දක්වා තොරතුරු ඇසුරෙන් **35** සහ **36** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව පත් කිරීම
B – අමාත්‍ය මණ්ඩලය පත් කිරීමේ බලය ජනාධිපතිවරයා සතු වීම
C – බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය සමග වූ ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම
D – අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා අගමැති වීම

**35.** 1972 ව්‍යවස්ථාව සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B
(2) A හා D
(3) B හා D
(4) C හා D

**36.** 1978 ව්‍යවස්ථාව හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) A හා B
(2) A හා D
(3) B හා D
(4) C හා D

- පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් **37** වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A – බොස්ටන් තේ සාදය
B – බැස්ටීලයට පහරදීම

**37.** ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ.
(2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

- පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර **38** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. පළමුවන ලෝක මහා සංග්‍රාමය
2. සරයේවෝ සිද්ධිය

B – 1. ජර්මනිය
2. මධ්‍ය බලවතුන්

C – 1. ආරක්ෂක මණ්ඩලය
2. ජාතීන්ගේ සංගමය

D – 1. දෙවන ලෝක මහා සංග්‍රාමය
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය

**38.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් **නොදැක්වෙන** යුගලය කුමක් ද?
(1) A
(2) B
(3) C
(4) D

**39.** පළමුවැන්න ඇතිවීමට දෙවැන්න හේතුවක් වූ බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A
(2) B
(3) C
(4) D

**40.** දෙවැන්න බිහිවූයේ පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස බව දැක්වෙන යුගලය කුමක් ද?
(1) A
(2) B
(3) C
(4) D

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2022 (2023)
# க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2022 (2023)
## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

විෂය අංකය / பாட இலக்கம்: 33

විෂයය / பாடம்: ඉතිහාසය

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 1 | 21. | 3 | 31. | 3 |
| 02. | 1 | 12. | 4 | 22. | 1 | 32. | 2 |
| 03. | 4 | 13. | 3 | 23. | 1 | 33. | 2 |
| 04. | 2 | 14. | 2 | 24. | 2 | 34. | 3 |
| 05. | 3 | 15. | 2 | 25. | 1 | 35. | 4 |
| 06. | 1 | 16. | 3 | 26. | 3 | 36. | 1 |
| 07. | 2 | 17. | 4 | 27. | 3 | 37. | 4 |
| 08. | 4 | 18. | 2 | 28. | 2 | 38. | 3 |
| 09. | 3 | 19. | 1 | 29. | 4 | 39. | 1 |
| 10. | 1 | 20. | 4 | 30. | 4 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கை பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

| | |
|---|---|
| **ඉතිහාසය** | **II** |
| வரலாறு | II |
| History | II |

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

- **I** කොටසේ ප්‍රශ්න අංක **1** අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න **හතරකට** ද, **III** කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

## I කොටස

**1. (අ)** (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

දඹකොළ පටුන, ඉරණමඩු, මාගම, අනුරාධපුරය, ගම්පොළ, මීගමුව, ගාලු වරාය, කලා වැව, යාන් ඔය, ගල් ඔය, මඩකලපුව, යෝධ වැව (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියමේ කොටසෙහි ලකුණු කර නම් කරන්න.

කොන්ස්තන්තිනෝපලය, සුවස් ඇළ, බොම්බාය, ප්‍රංශය, අරාබි මුහුද, පැනමා ඇළ (ලකුණු 06 යි)


**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාව ජනාවාස කළ මුල් ම මානවයා හඳුන්වන නම කුමක් ද?
*B* - "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතු ය." යන ප්‍රකාශය කළ පාලකයා කවුරුන් ද?
*C* - මොනාලිසා චිත්‍රය සිතුවම් කළ ශිල්පියාගේ නම සඳහන් කරන්න.
*D* - ගුවන් විදුලි තරංග මගින් පණිවුඩ යැවීමේ ක්‍රමය සොයාගත් නැනැත්තා කවුරුන් ද? (ලකුණු 04 යි)

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.


(ii) 1. *A* රූපයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
2. එය භාවිත කළේ කුමක් සඳහා ද?
3. මෙම නිර්මාණයට අයත් නටබුන් සොයාගත් ප්‍රදේශය කුමක් ද?
4. එය ක්‍රියාකරවීම සඳහා යොදාගත් ස්වාභාවික බලශක්තිය කුමක් ද?

(ලකුණු 04 යි)



*A*

(iii) 1. *B* රූපයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
2. එය නිර්මාණය කළේ කවුද?
3. මෙය භාවිත කළ කර්මාන්තය කුමක් ද?
4. එය භාවිත කරන ලද්දේ කුමන කරුණක් සඳහා ද?
(ලකුණු 04 යි)



*B*

## II කොටස

**2.** (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ එළිමහන් වාසස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා සිය වාසස්ථාන තෝරාගැනීමේ දී අවධානය යොමු කරන ලද කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා භාවිත කළ තාක්ෂණය කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) පැරණි සමාජයේ වී වගා කළ කන්න **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) අතීතයේ හේන්වල වගාකරන ලද බෝග වර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පැරණි කාලයේ මෙරට විවිධ කර්මාන්ත පැවති බව කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීතයේ මෙරට විධිමත් අභ්‍යන්තර වෙළෙඳාමක් පැවති ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය බෙදුන කොටස් **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත දැක්වෙන කරුණුවලට ගැළපෙන පිළිතුරු ලියන්න.

*A* - පැළැඳ ප්‍රදේශයේ බලකොටුවක් ඉදිකර පෘතුගීසි විරෝධී අරගලයක් ආරම්භ කළ තැනැත්තා
*B* - තෑගි ඔප්පුවකින් තම රාජ්‍ය උරුමය පෘතුගීසීන්ට පැවරූ රජතුමා
*C* - ආසියාවේ ලන්දේසි කටයුතු මෙහෙය වූ වෙළෙඳ සමාගම
*D* - ක්‍රි.ව. 1764 දී උඩරට ආක්‍රමණය මෙහෙය වූ ලන්දේසි ආණ්ඩුකාරවරයා (ලකුණු 04 යි)

(iii) පෘතුගීසීන් මහනුවර රාජ්‍යය අල්ලා ගැනීමට දරණ ලද ප්‍රයත්න **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ලන්දේසීන් මහනුවර රාජ්‍යය සමග සම්බන්ධතා පවත්වා ගැනීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්ති **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) මහනුවර රාජධානියේ ක්‍රියාත්මක වූ බද්දේ සංවිධාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) මහනුවර රාජධානියේ වැරදිකරුවන්ට ලබාදුන් දඬුවම් **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) මහනුවර රාජධානියේ ආර්ථික රටාවේ ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර රාජධානියේ සමාජ සංවිධානයේ දක්නට ලැබුණු ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

6. (i) බ්‍රිතාන්‍යයන් යටතේ කෝපි වගාව ව්‍යාප්ත වූ ප්‍රදේශ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) කෝපි වගාවේ පරිහානියට බලපෑ හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) තේ වගාවේ දියුණුවට බලපෑ සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) වතු වගාව හඳුන්වාදීම නිසා මෙරට ආර්ථිකයට හිතකර හා අහිතකර බලපෑම් සිදු වූ බව කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

7. (i) 1956 මහා මැතිවරණයේ දී ක්‍රියාත්මක වූ පංචමහා බලවේගයට අයත් පාර්ශව **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු මූලික මිනිස් අයිතිවාසිකම් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) නිදහසින් පසු ගතවූ දශක තුනක කාලය තුළ බලයට පත් රජයන් අධ්‍යාපනයේ දියුණුව සඳහා ගත් පියවර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ රජයන් විසින් වී ගොවිතැන දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## III කොටස

8. (i) බ්‍රිතාන්‍යයන් විසින් උතුරු අමෙරිකාවේ පිහිටුවන ලද ජනපද **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) යුරෝපීයයන් අමෙරිකාවේ ජනපද පිහිටුවීමට මුල් වූ හේතු **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ප්‍රංශ විප්ලවය ඇතිවීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) රුසියානු විප්ලවයේ ප්‍රතිඵල **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9. (i) පළමුවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ මධ්‍යම බල පක්ෂයට අයත් රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා ප්‍රකාශවලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

*A* - එක්සත් ජර්මනියක් නිර්මාණය කිරීමට පුරෝගාමී වූ නායකයා

*B* - පළමුවන ලෝක යුද සමයේ එංගලන්තයේ අගමැති

*C* - ඉතාලියේ පැසිස්ට් නායකයා

*D* - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිෂේධ බලය හිමි රටකි

(ලොයිඩ් ජෝර්ජ්, වින්ස්ටන් චර්චිල්, බෙනිටෝ මුසෝලිනි, ඇඩොල්ෆ් හිට්ලර්, චීනය, ඉන්දියාව, ඔටෝ වොන් බිස්මාර්ක්, කයිසර් විලියම්) (ලකුණු 04 යි)

(iii) පළමුවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

* * *

# II පත්‍රය

## I කොටස

**1. (අ)** (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

දඹකොල පටුන, ඉරණමඩු, මාගම, අනුරාධපුරය, ගම්පොළ, මීගමුව, ගාලු වරාය, කලා වැව, යාන් ඔය, ගල් ඔය, මඩකලපුව, යෝධ වැව (ලකුණු 12 යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

කොන්ස්තන්තිනෝපලය, සුවස් ඇළ, බොම්බාය, ප්‍රංශය, අරාබි මුහුද, ජපන් දූපත් (ලකුණු 06 යි)


**(ආ)** (i) පහත $A, B, C$ හා $D$ යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාව ජනාවාස කළ මුල් ම මානවයා හඳුන්වන නම කුමක් ද?
*B* - "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතු ය." යන ප්‍රකාශය කළ පාලකයා කවුරුන් ද?
*C* - මොනාලිසා චිත්‍රය සිතුවම් කළ ශිල්පියාගේ නම සඳහන් කරන්න.
*D* - ගුවන් විදුලි තරංග මගින් පණිවුඩ යැවීමේ ක්‍රමය සොයාගත් තැනැත්තා කවුරුන් ද? (ලකුණු 04 යි)

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. *A* රූපයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
2. එය භාවිත කළේ කුමක් සඳහා ද?
3. මෙම නිර්මාණයට අයත් නටබුන් සොයාගත් ප්‍රදේශය කුමක් ද?
4. එය ක්‍රියාකරවීම සඳහා යොදාගත් ස්වභාවික බලශක්තිය කුමක් ද?


(ලකුණු 04 යි)



*A*

(iii) 1. *B* රූපයෙන් නිරූපණය වන්නේ කුමක් ද?
2. එය නිර්මාණය කළේ කවුද?
3. මෙය භාවිත කළ කර්මාන්තය කුමක් ද?
4. එය භාවිත කරන ලද්දේ කුමන කරුණක් සඳහා ද?

(ලකුණු 04 යි)



*B*

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


**33 | STE | II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)**
**General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)**


**ඉතිහාසය II**
**வரலாறு II**
**History II**

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය / சுட்டெண் / Index No. ..........................



1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)



# I කොටස

01. (ආ)

(i) A - හෝමෝ සාපියන්/ හෝමෝසේපියන්

B - පළමුවන පරාක්‍රමබාහු රජතුමා/ මහා පරාක්‍රමබාහු

C - ලියනාඩෝ ඩාවින්චි/ ඩාවින්චි

D - ගුග්ලි මාර්කෝනි/ මාර්කෝනි

***(ලකුණු 01 X 04 = 04 යි.)***

(ii) A - යකඩ උණු කිරීමේ උඳුන/ යකඩ උඳුන/ යපස් උණු කිරීමේ උඳුන

B - යපස් නිස්සාරණය කිරීම/ යපස් උණු කිරීම/ යකඩ උණු කිරීම/ යකඩ නිස්සාරණය

C - සමනල වැව/ බලංගොඩ

D - සුළං බලය/ සුළං

***(ලකුණු 01 X 04 = 04 යි.)***

(iii) A - ආරක්ෂක ලාම්පුව

B - හම්ප්‍රි ඩේවි

C - ගල් අඟුරු

D - ආකර තුළට ආලෝකය ලබා ගැනීම/ ආලෝකය ලබා ගැනීම

## 2. ඉගෙනුම් පල :

***ශ්‍රී ලංකාවේ ප්‍රාග්, පූර්ව හා මුල් ඓතිහාසික යුග පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.***

# II කොටස

**2.** (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ එළිමහන් වාසස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා සිය වාසස්ථාන තෝරාගැනීමේ දී අවධානය යොමු කරන ලද කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා භාවිත කළ තාක්ෂණය කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

2.

(i) මිනිහාගල් කන්ද, බූන්දල, පතිරාජවෙල, බෙල්ලන්බැඳි පැලැස්ස, බණ්ඩාරවෙල, හෝර්ටන්තැන්න, උඩමළල

***(මින් තුනක් සඳහා ලකුණු 03යි)***

(ii) – ආහාර සඳහා ස්වාභාවික සම්පත් බහුල ප්‍රදේශ

– ජලය පහසුවෙන් ලබා ගත හැකි ස්ථාන

– ගල් මෙවලම් තනා ගැනීමට පාෂාණ වර්ග බහුල ප්‍රදේශ

– ගල් ගුහා සහිත ප්‍රදේශ (වර්ෂා කාලයේ)

– එළිමහන් ස්ථාන (වියළි කාලගුණයක් සහිත කාලයේ)

***(මින් දෙකක් සඳහා ලකුණු 04යි)***

(iii) – ලෝහ තාක්ෂණය/ කෘෂි මෙවලම් නිපදවීම

– මැටි භාණ්ඩ නිපදවීමේ තාක්ෂණය

– නිවාස ඉදිකිරීමේ තාක්ෂණය

– පබලු නිපදවීම/ ආභරණ හා රූපලාවන්‍ය කටයුතු සඳහා තාක්ෂණය

– සුසාන ඉදිකිරීමේ තාක්ෂණය

***(කරුණු 2ට ලකුණු 02යි***

***විස්තරයට ලකුණු 03යි = ලකුණු 05යි)***

(iv) – වාර්ෂික වර්ෂාපතනය

– භූ විෂමතාවය

– ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය

– ජල වහනය

– පසේ ස්වභාවය

***(මින් කරුණු තුනක් සඳහා ලකුණු 03***

***විස්තරයට ලකුණු 03යි = ලකුණු 06යි)***

## 3. ඉගෙනුම් පල :

***රජරට ශිෂ්ටාචාරයේ ආර්ථික තොරතුරු පෙන්වා දෙයි.***

**3.** (i) පැරණි සමාජයේ වී වගා කළ කන්න **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) අතීතයේ හේන්වල වගාකරන ලද බෝග වර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පැරණි කාලයේ මෙරට විවිධ කර්මාන්ත පැවති බව කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීතයේ මෙරට විධිමත් අභ්‍යන්තර වෙළෙඳාමක් පැවති ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3.

(i) යල, මහ, මැද (පිටදඩහස, මැදහස, අකලහස)

***(මින් 1 x 3 = ලකුණු 03යි)***

(ii) කුරක්කන්, කොල්ලු, උඳු, මුං, ඉරිඟු, මෑ, තණහාල්, තල, අබ, වී, උක්, කපු, කරබටු, වම්බටු, අලුපුහුල්, වට්ටක්කා, ඇල් වී, අල වර්ග

***(මින් 04ක් සඳහා ලකුණු 04යි)***

(iii) – ලෝහ කර්මාන්තය
- ➢ ලෝහ වර්ග
- ➢ ලෝහ වර්ග අනුව කර්මාන්ත

– මැණික් කර්මාන්තය
– ඇත්දත් කැටයම්
– මැටි කර්මාන්තය/ කුඹල්
– රෙදි විවීමේ කර්මාන්තය/ නූල් කැටීම/ පේෂ කර්මාන්තය
– වඩු කර්මාන්තය

*(කරුණු 2ට ලකුණු 02යි*

*විස්තරයට ලකුණු 03යි =ලකුණු 05යි)*

(iv) – වෙළෙඳ නගර පැවතීම
- ➢ නගරවල වෙළෙන්දන් සිටීම
- ➢ දේශීය විදේශීය වෙළෙඳුන්
- ➢ අනුරාධපුර
- ➢ මාගම

– වෙළෙඳාම ප්‍රධාන ජීවනෝපායක් වීම
– වෙළෙඳ සංවිධාන පැවතීම
– වෙළෙඳ පොළ පැවතීම
- ➢ ගම් හා නගර ආශ්‍රිතව පැවතීම/ කාලසුමන/ හෝපිටිගමුව/ මාගම
- ➢ වෙළෙඳ පොළෙන් ගත් භාණ්ඩ
- ➢ සොරබොර වැව් ලිපිය

– වෙළෙඳ නීති හා වෙළෙඳ නිලධාරීන්
– කිරුම් මිණුම් ක්‍රම භාවිතය

* දෙමළ නාගරිකරණ (නැත)

*(කරුණු 03ට ලකුණු 03යි.*

*විස්තරයට ලකුණු 03යි =ලකුණු 06යි)*

## 4. ඉගෙනුම් පල :

***බටහිර ජාතීන්ගේ පැමිණීම සහ එකල ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය පැහැදිලි කරයි.***

4. (i) විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍යය බෙදුන කොටස් **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත දැක්වෙන කරුණුවලට ගැළපෙන පිළිතුරු ලියන්න.
- *A* - පැළැඳ ප්‍රදේශයේ බලකොටුවක් ඉදිකර පෘතුගීසි විරෝධී අරගලයක් ආරම්භ කළ තැනැත්තා
- *B* - තෑගි ඔප්පුවකින් තම රාජ්‍ය උරුමය පෘතුගීසීන්ට පැවරූ රජතුමා
- *C* - ආසියාවේ ලන්දේසි කටයුතු මෙහෙය වූ වෙළෙඳ සමාගම
- *D* - ක්‍රි.ව. 1764 දී උඩරට ආක්‍රමණය මෙහෙය වූ ලන්දේසි ආණ්ඩුකාරවරයා (ලකුණු 04 යි)

(iii) පෘතුගීසීන් මහනුවර රාජ්‍යය අල්ලා ගැනීමට දරණ ලද ප්‍රයත්න **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ලන්දේසීන් මහනුවර රාජ්‍යය සමග සම්බන්ධතා පවත්වා ගැනීමේ දී අනුගමනය කළ ප්‍රතිපත්ති තුනක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

4.

(i) කෝට්ටේ, සීතාවක, රයිගම

*(ලකුණු 03යි)*

(ii) A - වීදිය බණ්ඩාර

B - ධර්මපාල/දොන් ජුවන් ධර්මපාල

C - පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම/ ලන්දේසි පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම / VOC

D - බැරන් වැන් එක් / බැරන් ෆන් එක්

***(1 × 4 = ලකුණු 04යි)***

(iii)

– දෝන කතිරිනා උඩරට සිංහාසනයට පත්කිරීම සඳහා කළ සටන

– 1594 දී පේරෝ ලෝපේස් ද සූසා යටතේ ආක්‍රමණය (දන්තුරේ සටන)

– 1602 අසවේදු යටතේ උඩරට ආක්‍රමණය (බලන සටන)

– 1630 කොන්තන්තීනුද සා යටතේ ආක්‍රමණය (රන්දෙණිවල සටන)

– 1638 දියෝගෝදමේලෝ යටතේ උඩරට ආක්‍රමණය (ගන්නොරුව සටන)

***(මෙම කරුණු අතරින් දෙකක් විස්තර කිරීම.***
***කරුණු දෙකට ලකුණු 02යි. විස්තරයට ලකුණු 03යි =ලකුණු 05යි)***

(iv) – ලන්දේසි වෙළඳ සමාගමට පාඩු සිදුවන ගැටලු වලින් වැලකී සිටීම

– උඩරට රජුගේ හිත දිනාගැනීමට කටයුතු කිරීම

– රජුගේ ආගමික කටයුතු වලට සහයෝගය දැක්වීම

– උපරිම ආර්ථික වාසි ලබා ගැනීමේ ප්‍රතිපත්තිය

- ➢ වෙනත් විදේශීය ජාතියක් සමඟ සම්බන්ද වීමේ අවස්ථා අවහිර කිරීම
- ➢ කඩවත් වැසීම

***කරුණු 03කට ලකුණු 03යි)***
***විස්තරයට ලකුණු 03යි = ලකුණු 06යි)***

## 5. ඉගෙනුම් පල :

***මහනුවර රාජධානියේ සමාජ, ආර්ථික තොරතුරු විමර්ශනය කරයි***

| | | |
|---|---|---|
| **5.** (i) | මහනුවර රාජධානියේ ක්‍රියාත්මක වූ බද්දේ සංවිධාන **තුනක්** නම් කරන්න. | (ලකුණු 03 යි) |
| (ii) | මහනුවර රාජධානියේ වැරදිකරුවන්ට ලබාදුන් දඬුවම් **හතරක්** නම් කරන්න. | (ලකුණු 04 යි) |
| (iii) | මහනුවර රාජධානියේ ආර්ථික රටාවේ ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. | (ලකුණු 05 යි) |
| (iv) | මහනුවර රාජධානියේ සමාජ සංවිධානයේ දක්නට ලැබුණු ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

5.

(i) – මඩිගේ බද්ද

– කුරුවේ බද්ද

– බඩහැල බද්ද

– රදා බද්ද

– හැඟ බද්ද

***(මින් 3ක් සඳහා ලකුණු 03යි)***

(ii) අතුල් පහර ගැසීම/ කස පහර දීම/ රොඩි රැහැට දැමීම/ දඬු ගැසීම/ ඉපලෙන් තැලීම/ හිසකෙස් කැපීම/ දඬු කඳේ ගැසීම/දඟගෙයි ලෑම/ දියේ ගිල්වා මැරීම/ ඇතුන් ලවා පෑගීම/ පිටුවහල් කිරීම/ උල තැබීම

***(මින් 4කට ලකුණු 04යි)***

(iii) – කෘෂිකර්මාන්තය හා බැඳුණු අර්ථ ක්‍රමය
– ස්වයංපෝෂිත ආර්ථික රටාව
– වී වගාව
– හේන් ගොවිතැන
– ගෙවතු වගාව
– සත්ත්ව පාලනය
– විවිධ කර්මාන්ත

***(මින් කරුණු 02ක් ලිවීමට ලකුණු 02යි.***
***විස්තරයට ලකුණු 03යි = ලකුණු 05යි)***

(iv) – රටේ සියලු ඉඩම් අයිතිය රජු සතුවීම
– ඉඩම්, අයිතිය හා භුක්තිය පදනම්ව කොටස් වලට බෙදා තිබීම
– රාජකාරී සේවා ක්‍රමය
– ග්‍රාමීය සමාජයක් වීම
– සමාජ සම්බන්ධතා කුල ක්‍රමය මත පදනම් වීම
– මූලික විවාහ ක්‍රම තුනක් පැවතීම
– පවුල ප්‍රධාන සමාජ ඒකකය වීම
– ගුණ ගරුක බව සමාජය තුළ දක්නට ලැබීම
– සියලු කටයුතු අත්තම් ක්‍රමයට සිදු වීම

***(කරුණු 03ට ලකුණු 03යි.***
***විස්තරයට ලකුණු 03යි = ලකුණු 06යි)***

## 6. ඉගෙනුම් පල :

***බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස් වීම් පැහැදිලි කරයි.***

**6.** (i) බ්‍රිතාන්‍යයන් යටතේ කෝපි වගාව ව්‍යාප්ත වූ ප්‍රදේශ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) කෝපි වගාවේ පරිහානියට බලපෑ හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)
(iii) තේ වගාවේ දියුණුවට බලපෑ සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) වතු වගාව හඳුන්වාදීම නිසා මෙරට ආර්ථිකයට හිතකර හා අහිතකර බලපෑම් සිදු වූ බව කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

6.

(i) දුම්බර මිටියාවත, ගම්පොල, පේරාදෙණිය, මාතලේ, බදුල්ල, මහනුවර

***(මින් තුනක් සඳහා ලකුණු 03යි.)***

(ii) – ලන්ඩන් වෙළෙඳ පොළේ ශ්‍රී ලංකාවේ කෝපි සඳහා ඇති ඉල්ලුම අඩුවීම
– ලෝක ආර්ථික පරිහානිය
– කෝපි කොළ රෝගය පැතිරීම
– කෝපිවලට වඩා තේ වගාව ශ්‍රී ලංකාවේ සාර්ථක වීම

***(මින් කරුණු 02ක් සඳහා ලකුණු 04යි.)***

(iii) – වියළි කලාපය හැර මෙරට සෙසු ප්‍රදේශවල වගාව සාර්ථක වීම
- ලෝක වෙළෙඳ පොළේ මෙරට තේ සඳහා ඉල්ලුම වැඩිවීම
- ගුණාත්මක තේ නිෂ්පාදනය කළ හැකිවීම
- ලාබදායී ශ්‍රමය ලබා ගැනීම
- මාර්ග පහසුකම් දියුණු වීම නිසා ප්‍රවාහනය පහසු වීම
- තේ වගාව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම
- තේ වගාව සඳහා විදේශීය ආයෝජකයින් පැමිණීම
- යටිතල පහසුකම් දියුණු කිරීම

***(මින් කරුණු 02ට ලකුණු 02යි.***
***විස්තරයට ලකුණු 03යි = ලකුණු 05යි)***

(iv) **හිතකර බලපෑම්**
- අපනයන වැවිලි බෝග හඳුන්වා දීම
- වර්තමානයේත් ප්‍රධාන ආදායමක් වීම
- වෙළෙඳාමේ දියුණුව
- වතු වගාව ආශ්‍රයෙන් විවිධ ව්‍යාපාර වර්ධනය වීම
  - ➢ නිවාඩු නිකේතන, සමාජ ශාලා
  - ➢ ආපනාශාලා
  - ➢ රෙදිපිළි කර්මාන්ත
  - ➢ නව යන්ත්‍රෝපකරණ අළෙවිය
  - ➢ රැකියා බිහිවීම
  - ➢ වතු කම්කරුවන්ගේ (ඉන්දියානු) ශ්‍රමය අඩු වැටුපට ලබාගැනීම

කාර්මිකරණය වෙළඳාම [illegible]
කාර්මික පන්තියක් දියුණු කිරීම

**අහිතකර බලපෑම්**
- දේශීය කෘෂිකර්මාන්තය පිරිහීම
- මුදල් මත සියල්ල තීරණය වීම
- ඉඩම් අහිමි ජනතාවක් බිහි වීම
- රටේ බහුතර ජනතාවක් දුප්පත් වීම
- මත්පැන් භාවිතය ප්‍රචලිත වීම

– දේශීය දැනුම පිරිහීම

***(ඉහත කරුණු තුනකට ලකුණු 03යි***
***විස්තරයට ලකුණු 03යි = ලකුණු 06යි)***

## 7. ඉගෙනුම් පල :

***නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ශුභ සාධන කටයුතු විමසා බලයි.***

**7.** (i) 1956 මහා මැතිවරණයේ දී ක්‍රියාත්මක වූ පංචමහා බලවේගයට අයත් පාර්ශව **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු මූලික මිනිස් අයිතිවාසිකම් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) නිදහසින් පසු ගතවූ දශක තුනක කාලය තුළ බලයට පත් රජයන් අධ්‍යාපනයේ දියුණුව සඳහා ගත් පියවර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ රජයන් විසින් වී ගොවිතැන දියුණු කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

07. (i) සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු

***(මින් 03ක් සඳහා ලකුණු 03යි)***

(ii) – නීතිය ඉදිරියේ සැම දෙනෙකුම සමාන වීම
- කතා කිරීම හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස
- වද හිංසා වලින් මිදී සිටීමේ නිදහස
- කැමති ආගමක්, ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ නිදහස
- කැමති වෘත්තියක්, රැකියාවක් කිරීමේ නිදහස
- රට තුළ කැමති ස්ථානයක වාසය කිරීමේ නිදහස

***(මින් 02ක් සඳහා ලකුණු 04යි)***

(iii) – නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය අනුව අධ්‍යාපන කටයුතු දියුණු කිරීම
- රට පුරා පාසල් පිහිටුවීම
- විෂයමාලා සංවර්ධනය හා ගුරු පුහුණුව නවීකරණය කිරීම
- විද්‍යාගාර හා පාසල් පුස්තකාල පහසුකම් ව්‍යාප්ත කිරීම
- ශිෂ්‍ය ශුභසාධනය හා උපකාරක සේවා වැඩි දියුණු කිරීම
  - ➢ දිවා ආහාරය, පාසල් පොත්, වෛද්‍ය හා දන්ත වෛද්‍ය සේවා, පාසල් නිල ඇඳුම්, නොමිලයේ ලබා දීම
  - ➢ සහනදායී මිලකට ගමනාගමන පහසුකම් ලබාදීම
- ආධාර ලබන පාසල් රජයට පවරා ගැනීම
- වෘත්තීය අධ්‍යාපන ආයතන පිහිටුවීම
- නව විශ්වවිද්‍යාල පිහිටුවීම
- ~~ගුරු උපදේශක සේවය පිහිටුවීම~~
- අධ්‍යාපන ප්‍රතිපත්ති රටාවේ නවීකරණය.

***(මින් කරුණු 02ට ලකුණු 02යි.***

***විස්තරයට ලකුණු 03යි = ලකුණු 05යි)***

(iv) – නව ගොවි ජනපද පිහිටුවීම

- ➢ ගොවි ජනපද [illegible] පිහිටුවීම
- ➢ මේ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීම
- ➢ වියළි කලාපයේ වැව් අමුණු ප්‍රතිසංස්කරණය කර එහි ප්‍රයෝජන ජනතාවට ලබාදීම
- ➢ ප්‍රථම අස්වැන්න නෙලන තෙක් ආධාර ලබාදීම
- ➢ අස්වැන්න අලෙවියට පහසුකම් ලබාදීම

– මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය

- ➢ මහවැලි ගංගාවේ ජලය උපයෝගී කර ගනිමින් විශාල ජලාශ ඉදිකිරීම
- ➢ මහවැලි ජලයෙන් වියළි කලාපය පෝෂණය කිරීම

– වී පර්යේෂණ ආයතන පිහිටුවීම/වැඩි අස්වැන්නක් දෙන බීජ හඳුන්වා දීම

– ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටුවීම

– රජයේ බැංකු මගින් ගොවීන්ට ණය ආධාර ලබාදීම

– වී අලෙවි මණ්ඩලය පිහිටු වීම

– පොහොර භාවිතය ප්‍රචලිත කිරීම

– ගොවි විශ්‍රාම ක්‍රමයක් හඳුන්වා දීම

– කෘෂි රක්ෂණ ක්‍රමය හඳුන්වා දීම

– නව වාරිමාර්ග ඉදි කිරීම

***(මින් කරුණු 03ට ලකුණු 03යි.***
***විස්තරයට ලකුණු 03යි = ලකුණු 06යි)***

## 8. ඉගෙනුම් පල :

***ලෝකයේ කැපී පෙනෙන විපල්ව ඇසුරින් ගොඩනැගුණු දේශපාලන ප්‍රවණතා පෙන්වා දෙයි.***

**III කොටස**

**8.** (i) බ්‍රිතාන්‍යයන් විසින් උතුරු අමෙරිකාවේ පිහිටුවන ලද ජනපද **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) යුරෝපීයයන් අමෙරිකාවේ ජනපද පිහිටුවීමට මුල් වූ හේතු **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ප්‍රංශ විප්ලවය ඇතිවීමට බලපෑ හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) රුසියානු විප්ලවයේ ප්‍රතිඵල **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

08. (i) වර්ජිනියා, මැසචුසෙට්ස්, නිව්යෝර්ක්, නිව්හැම්ෂයර්, මේරිලන්ඩ්, කනෙක්ටිකට්, රෝඩ් අයිලන්ඩ්, ඩෙලවෙයාර්, උතුරු කැරලිනා, නිව් ජර්සි, දකුණු කැරලිනා, පෙන්සිල්වේනියා, ජෝර්ජියා

***(මින් නම් 03කට ලකුණු 03යි.)***

(ii) – යුරෝපයේ ආගමික ගැටුම් නිසා ආගමික නිදහස පතා නව ප්‍රදේශ වෙත ජනතාව යොමු වීම

– නව ප්‍රදේශවල ඉඩම් අත්පත් කර ගනිමින් ජීවිතය පහසුකර ගැනීම

– කීර්තිය හා ධනය වර්ධනය කිරීමේ අරමුණින් යුරෝපා රටවල් නව ජනාවාස පිහිටුවීමට උනන්දු කරවීම

***(මින් කරුණු 02ට ලකුණු 04යි.)***

(iii) – රාජාණ්ඩු පාලකයින් සතු අසීමිත බලය

- ➢ දූෂිත පාලනය
- ➢ සතුරන් මැඩ පැවැත්වීමට ගත් ක්‍රියාමාර්ග
- ➢ රජුගේ අධි සුඛෝපභෝගී ජීවිතය

– ජනතාව හා රජු අතර සබඳතා දුරස්වීම

- ➢ ජනතාවට රජු බැහැදැකීමට අවසර නොවීම
- ➢ රජු වටා සිටි පූජකයින් හා රදලයින් විසින් ජනතාව පිළිබඳ නිවැරදි තොරතුරු රජුට ලබා නොදීම

– රාජාණ්ඩුවේ අතිශය දූෂිත බව

- ➢ රජුගේ උපදේශක මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩලයේ දූෂිත ක්‍රියා කලාපය
- ➢ ප්‍රාදේශීය පාලනයේ අකාර්යක්ෂම බව
- ➢ ඉන්ටෙන්ඩාන්ට් නිලදාරීන් පත්කිරීමෙන් ජනතාව පීඩාවට පත්වීම

– රටේ බහුතර ජනතාව වූ සාමාන්‍ය ජනතාවට වරප්‍රසාද අහිමි වීම

- ➢ මධ්‍යම පන්තියට දේශපාලන වරප්‍රසාද අහිමි වීම
- ➢ ඉඩම්වල අයිතිය පූජකවරු හා රදලයින් සතු වීමෙන් ජනතාව වඩාත් පීඩාවට පත්වීම

– රදලවරු සතු වරප්‍රසාද

– අසාධාරණ බදු ක්‍රමය

– දාර්ශනික මතවාද

– පල්ලියේ ආධිපත්‍ය

– අනවශ්‍ය යුධ වියදම

– වසර 175 පමණ කාලයක සිට ස්ටේට් ජනරල් සභාව කැඳවා නොතිබීම

– මධ්‍යම පන්තියට දේශපාලන හා ආර්ථික වරප්‍රසාද අහිමි වීම.

***(මින් කරුණු 2ක් සඳහා ලකුණු 02යි.***
***විස්තරයට ලකුණු 03යි = ලකුණු 05යි)***

(iv) – සාර් පාලනය හා රාජාණ්ඩු ක්‍රමය බිඳ වැටීම

–ලෙනින්ගේ නායකත්වයෙන් කොමියුනිස්ට් ආණ්ඩුවක් බිහිවීම

- ➢ සමාජවාදී දර්ශනය අනුව කටයුතු කිරීම
- ➢ සමූහ අයිතිය – සමූහ ගොවිපල සාමූහික ගොවිපල.

– ජනසතු කිරීමේ ව්‍යාපාරය

- ➢ කර්මාන්තශාලා, බැංකු, ගමනාගමනය

– රුසියාව සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය බවට පත්වීම

– සමාජවාදී දර්ශනය ලොව පුරා ව්‍යාප්ත වීම

***(මින් කරුණු 3ක් සඳහා ලකුණු 03යි.***

***විස්තරයට ලකුණු 03යි = ලකුණු 06යි)***

## 9. ඉගෙනුම් පල :

***ලෝක යුද්ධ පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි***

**9.** (i) පළමුවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ මධ්‍යම බලවතුන්ට අයත් රටවල් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා ප්‍රකාශවලට ගැළපෙන පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.

*A* - එක්සත් ජර්මනියක් නිර්මාණය කිරීමට පුරෝගාමී වූ නායකයා

*B* - පළමුවන ලෝක යුද සමයේ එංගලන්තයේ අගමැති

*C* - ඉතාලියේ පැසිස්ට් නායකයා

*D* - එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිෂේධ බලය හිමි රටකි

(ලොයිඩ් ජෝර්ජ්, වින්ස්ටන් චර්චිල්, බෙනිටෝ මුසෝලිනී, ඇඩොල්ෆ් හිට්ලර්, චීනය, ඉන්දියාව, ඔටෝ වොන් බිස්මාර්ක්, කයිසර් විලියම්) (ලකුණු 04 යි)

(iii) පළමුවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක යුද්ධය ඇතිවීමට තුඩුදුන් හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9.

(i) නිදහස් ලකුණු

***(ලකුණු 03යි)***

(ii) A - ඔටෝ වොන් බිස්මාර්ක්

B - ලොයිඩ් ජෝර්ජ්

C - බෙනිටෝ මුසෝලිනි

D - චීනය

***(1 x 4 = ලකුණු 04යි)***

(iii) – මධ්‍යම බලවතුන් පරාජයට පත්වීම
- මිත්‍ර පිළ ජයගැනීම
- විශාල ජීවිත හා දේපල හානි
- වර්සේල්ස් ගිවිසුම / ජර්මනියට දඬුවම් පැමිණවීම
- යුරෝපයේ ඒකාධිපති රාජාණ්ඩු බිඳ වැටීම හා නව රාජ්‍ය බිහිවීම
- යුරෝපයේ ආර්ථික පරිහාණිය
- ජාතීන්ගේ සංගමය බිහිවීම
- ජන වර්ග ප්‍රාන්තීකරණය නිදහස් රාජ්‍ය බිහිවීම.

***(කරුණු 02ට ලකුණු 02යි.***

***විස්තරයට ලකුණු 03 = ලකුණු 05යි)***

(iv) – හිට්ලර්ගේ ක්‍රියාකලාපය
- මුසෝලිනීගේ ක්‍රියාකලාපය
- ජපානයේ ක්‍රියාකලාපය
- ජාතීන්ගේ සංගමයේ දුර්වලතා
- හිට්ලර්ගේ පෝලන්ත ආක්‍රමණය.

***(කරුණු 03ට ලකුණු 03යි.***

***විස්තරයට ලකුණු 03 = ලකුණු 06යි)***

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI



Download past papers, notes, and more from Past Papers Wiki!